Nestlé Good food, Good life

# මාධ්‍ය නිවේදනය

2022, ජූලි 11, කොළඹ

## නෙස්ලේ ලංකා සමාගම, පෙරේරා ඇන්ඩ් සන්ස් බේකර්ස් පුද්ගලික සමාගම සමඟ එක්ව, ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය මැඩලීමට සහයෝගීතාවකට එළඹෙයි

ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය අවම කිරීම සඳහා සුවිශේෂී වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට නෙස්ලේ ලංකා සමාගම සහ පෙරේරා ඇන්ඩ් සන්ස් බේකර්ස් පුද්ගලික සමාගම පසුගියදා අත්වැල් බැඳගත්තේය. මෙම සහයෝගීතාව යටතේ, පෙරේරා ඇන්ඩ් සන්ස් අවන්හල් ජාලය තුළ එක්රැස්වන ප්ලාස්ටික් ඇසුරුම් හා අපද්‍රව්‍ය ප්‍රතිචක්‍රීකරණය කරනු ලබන අතර, එම අවන්හල් ජාලය තුළ විවිධ අපද්‍රව්‍ය වර්ග සඳහා වෙන වෙනම කසල බඳුන් තැන්පත් කිරීමත්, එසේ එකතු කරගන්නා කසල රාජගිරියේ පිහිටි පෙරේරා ඇන්ඩ් සන්ස් සතු ප්‍රතිචක්‍රීකරණ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානය වෙත යොමු කිරීමත් සිදුවේ. ඉන් අනතුරුව පිරිසිදු කර, සම්පීඩනය කළ මෙම කසල, ප්‍රතිචක්‍රීකරණය වෙනුවෙන් Eco-Maximus සහ Eco-Spindles යන දේශීය ආයතන වෙත ප්‍රවාහනය කරනු ලැබේ. වර්තමානයේදී මෙම වැඩපිළිවෙල යටතේ පෙරේරා ඇන්ඩ් සන්ස් අවන්හල් 100කට අධික ප්‍රමාණයක් ආවරණය කෙරෙන අතර, ඉදිරියේදී සමස්ත දිවයිනේම ඇති එම අවහන්හල් වෙත එය ව්‍යාප්ත කිරීමට සැලසුම් සකස් කර තිබේ.

මෙම සහයෝගීතාව යටතේ, රාජගිරියේ පිහිටි පෙරේරා ඇන්ඩ් සන්ස් ප්‍රතිචක්‍රීකරණ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ මධ්‍යස්ථානයේ බේලින් යන්ත්‍රයක් (baling machine) පිහිටුවීමට නෙස්ලේ ලංකා සමාගම සහාය වී ඇත. බේලින් යන්ත්‍රයක් යනු කසල සම්පීඩනයට ලක්කරමින් ප්‍රතිචක්‍රීකරණය සඳහා ප්‍රවාහනය කිරීම පහසු කරවන යන්ත්‍රයකි.

"ශ්‍රී ලංකාවේ Out-Of-Home ව්‍යාපාර අංශයේ ප්‍රමුඛයෙක් වශයෙන් Nestlé Professionalහි අපට මෙරට දැවැන්තම බේකරි අවන්හල් ජාලය සමඟ අත්වැල් බැඳගනිමින්, මෙවැනි පරිසර හිතකාමී ව්‍යාපෘතියක් ක්‍රියාවට නැංවීමට ලැබීම විශාල සතුටක්. මෙම සහයෝගීතාව තුළින් වගකීම් සහගත ලෙස කසල බැහැර කිරීමට පාරිභෝගිකයින් දිරිමත් කරමින්, පෙරේරා ඇන්ඩ් සන්ස් අවන්හල් ආශ්‍රිතව ප්‍රතිචක්‍රීකරණය කළ හැකි කසල එක්රැස් කිරීමේ බඳුන් පිහිටුවනවා. අපද්‍රව්‍යවලින් නිදහස් අනාගතයක් ශ්‍රී ලංකාව තුළ උදාකරගැනීම වෙනුවෙන් ගත් සුවිශේෂී පියවරක් ලෙස මෙය හැඳින්විය හැකියි" යනුවෙන් Nestlé Professional සභාපති රොෂාන් පෙරේරා මහතා ප්‍රකාශ කළේය.

"දේශීය බේකරි අවන්හල් ජාලයක් වශයෙන් ශ්‍රී ලංකාව තුළ ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය මැඩලීම සඳහා මෙවැනි දායකත්වයක් ලබාදීමට හැකිවීම පිළිබඳ අපි සතුටට පත්වෙනවා. අප වැනි බේකරි අවන්හල් හරහා ඇසුරුම් ආශ්‍රිත අපද්‍රව්‍ය සැලකිය යුතු ප්‍රමාණයක් නිර්මාණය වෙනවා. ඒ නිසාම එම අපද්‍රව්‍ය එක්රැස් කිරීමටත්, ප්‍රතිචක්‍රීකරණය සඳහා යොමු කිරීමටත් වැඩි හැකියාවක් අප සතුයි. අපගේ පාරිභෝගිකයින්ගෙනුත්, වගකීම් ලෙස කසල නිසි පරිදි බැහැර කරමින් ඒවා ප්‍රතිචක්‍රීකරණය කිරීමට දායක වන ලෙස අපි ඉල්ලා සිටිනවා" යැයි මෙම සහයෝගීතාව පිළිබඳ

අදහස් දක්වමින් පෙරේරා ඇන්ඩ් සන්ස් බේකර්ස් පුද්ගලික සමාගමේ විධායක අධ්‍යක්ෂ කමල් ජයිමන් මහතා පැවසුවේය.

පිවිතුරු සහ හරිත රටක් නිර්මාණය කිරීම සඳහා දායක වෙමින් 'යහපත් ආහාර, යහපත් ජීවිතයක්' (Good food, Good life) යන තේමාව ඇසුරු කරගත් නෙස්ලේ ලංකා සමාගම ශ්‍රී ලංකාවේ ප්ලාස්ටික් අපද්‍රව්‍ය අවම කිරීම වෙනුවෙන් විවිධ ව්‍යාපෘති ගණනාවකට මුල පුරා තිබේ. මේ පිළිබඳ අදහස් දක්වමින් නෙස්ලේ ලංකා කළමනාකාර අධ්‍යක්ෂ ජේසන් ඇවන්සෙනයා මහතා මෙසේ ප්‍රකාශ කළේය.

"ප්ලාස්ටික් නිසා සිදුවන පරිසර දූෂණය අවමකිරීම නෙස්ලේ ආයතනයේ ප්‍රමුඛතාවක්. ඒ අනුව, අපගේ කිසිදු නිෂ්පාදන ඇසුරුමක්, කසල අංගනයකට හෝ සාගරයට එක් නොවීම තහවුරු කරගැනීමට අපි විවිධ පාර්ශ්වකරුවන් සමඟ සහයෝගයෙන් කටයුතු කරනවා. මේ වනවිට නෙස්ලේ නිෂ්පාදන ඇසුරුම්වලින් බර අනුව 80%ක්ම ප්‍රතිචක්‍රීකරණය කළ හැකි තත්ත්වයට ගෙනැවිත් ඇති අතර, වර්ෂ 2025 වනවිට අපගේ නිෂ්පාදන ඇසුරුම් බර අනුව 100%ක්ම නැවත භාවිත කළ හැකි හෝ ප්‍රතිචක්‍රීකරණය කළ හැකි අමුද්‍රව්‍ය යොදා නිපදවීමට අපි කැපවී සිටිනවා. ඊට අමතරව, රට තුළ අපද්‍රව්‍ය එක්රැස් කිරීමේ ක්‍රමවේද සහ ප්‍රතිචක්‍රීකරණය කිරීමේ යටිතල පහසුකම් නැංවීමේ කාර්යයටත් අප උර දී සිටිනවා. පාරිභෝගිකයින් තුළ ධනාත්මක හැසිරීමක් ඇති කිරීමත් ඊට ඇතුළත්. එම පසුබිම තුල, පෙරේරා ඇන්ඩ් සන්ස් ආයතනය සමඟ ඇති කරගත් මෙම සහයෝගීතාවත් ශ්‍රී ලංකාවේ තිරසරභාවය නැංවීමට අප ගන්නා ප්‍රයත්නය තවත් ශක්තිමත් කරනු ඇති බව මට විශ්වාසයි."

නෙස්ලේ යනු වසර 115කට වැඩි කාලයක් පුරා ශ්‍රී ලාංකික ජීවිතවලට බද්ධ වූ සමාගමකි. වර්තමාන මෙන්ම අනාගත පරපුරටත් ජීවිතයේ ගුණාත්මකබව වර්ධනය කරගැනීම සඳහා ආහාර සතු ශක්තිය මුදාහැරීමේ අරමුණ සමඟ ක්‍රියා කරන නෙස්ලේ සමාගම, තම ආහාර සහ පාන වර්ග නිෂ්පාදන පෙළ හරහා මුල් ළමාවියේ සිට වැඩිහිටි විය දක්වා පුළුල් පරාසයක පාරිභෝගිකයින්ට සමීප වී ඇත. ශ්‍රී ලංකාව තුළ අලෙවි කරනු ලබන නෙස්ලේ නිෂ්පාදනවලින් 90%කට වැඩි ප්‍රමාණයක් කුරුණෑගල පිහිටි එම සමාගමට අයත් අති නවීන කර්මාන්තශාලාවේ නිපදවනු ලබන්නේ නෙස්ලේහි ගෝලීය උසස් ප්‍රමිතීන් අනුගමනය කරමිනි.

---

**Contact:**

Corp. Public Affairs Damitha Kulatunga +94777915949 Damitha.Kulatunga@lk.nestle.com